

සාදු! සාදු! මම ගෞතම මුනිඳු සරණ යන්නේ .....!

ගරු කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමින් වහන්සේගේ
හඬපටයක් ඇසුරිනි

සුමධුර ධර්ම දේශනා හා බුදු රජාණන් වහන්සේ දේශිත සූත්‍ර දේශනා පැහැදිලි කිරීම් වලට සවන් දිමට
www.mahamevna.org වෙබ් අඩවියට පිවිසෙන්න

“දසබලසේලප්පභවා නිබ්බානමහාසමුද්දපරියන්තා
අට්ඨංග මග්ගසලිලා ජිනවචනනදී චිරං වහතූති”

දසබලයන් වහන්සේ නමැති ශෛලමය පර්වතයෙන් පැන නැගී
අමා මහා නිවන නම් වූ මහා සාගරය අවසන් කොට ඇති
ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වූ සිහිල් දිය දහරින් හෙබි
උතුම් ශ්‍රී මුඛ බුද්ධ වචන ගංගාව
(ලෝ සතුන්ගේ සසර දුක නිවාලමින්)
බොහෝ කල් ගලාබස්නා සේක්වා!

*(සළායතන සංයුත්තය - උද්දාන ගාථා)*

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස




ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා



සම්බුදු හිමි දෙසූ සදහම් අවිදු අඳුර දුරු කර ලූ
පවසන සුමිහිරි වදනින් මිස දිටු බව සිඳ බිඳ ලූ
සම්දුනි ඔබ සිරිපා යුග පින්වත් නැණනඳ තෙරිඳුන්
වදිනෙමු හද පිරි බැතියෙන් පිලිගමු බැතිබර සතුටින්



රාග – ද්වේෂ - මෝහ නොමැති සිතකින් යුතු වන්නේ
සිල් සමාධි ගුණ නුවණැති නිවන් සුවය දන්නේ

තුන් ලොව වැදුමන් ලැබුමට හිමියෙන් හිමි වන්නේ
“අරහං” යන ගුණයෙන් යුතු බුදුහිමි නමදින්නේ

සාදු! සාදු! මම ගෞතම මුනිදු සරණ යන්නේ .....!



ගුරු උපදෙස් කිසිවක් නැති සෘජු ගමනකි යන්නේ
පෙරුම් පුරාගෙන ආ බල රැකවරණොට එන්නේ

දසබල බුදු නුවණ ඇතිව තුන්ලොව ජය ගන්නේ
“සම්මා සම්බුදු” ගුණ යුතු බුදුහිමි නමදින්නේ

සාදු! සාදු! මම ගෞතම මුනිඳු සරණ යන්නේ .....!



කෙලෙසුන් තොර නුවණ ඇතිව පෙර භවයන් දන්නේ
ඉපදෙන මැරෙන සසරේ ඇති හතු වැටහෙන්නේ

හිරු සඳු ලෙස නුවණ ඇතිව දහමෙහි හැසිරෙන්නේ
“විජ්ජාචරණින්” යුතු වූ බුදුහිමි නමදින්නේ



සුන්දර වූ නිවන් මඟෙහි සොඳින් වැඩම වන්නේ
අමා නිවන් සුවය විඳින සිතකින් යුතු වන්නේ

සිත - කය - වචනය හැමවිට සොඳුරුව පවතින්නේ
"සුගත" ගුණෙන් යුතු ගෞතම මුනිඳුන් නමදින්නේ

සාදු! සාදු! මම ගෞතම මුනිඳු සරණ යන්නේ .....!



දෙව්ලොව - බඹලොව - මනුලොව - සතර අපා දන්නේ
කළකම් පලදෙමින් සතුන් ඒ ඒ තැන යන්නේ

ලොව උපදින - ලොවෙන් මිදෙන මඟ මැනැවින් දන්නේ
"ලෝක විදූ" ගුණයෙන් යුතු බුදුහිමි නමදින්නේ

සාදු! සාදු! මම ගෞතම මුනිඳු සරණ යන්නේ .....!



මහා කාරුණික ගුණ ඇති බුදු නෙත යොමු වන්නේ
දෙසනා විට සිරි සදහම් ලොව දමනය වන්නේ

සසරේ සැරිසරන සතුන් එයින් එතෙර වන්නේ
"අනුත්තරෝ පුරිසධම්ම සාරථි" නම් වන්නේ

සාදු! සාදු! මම ගෞතම මුනිඳු සරණ යන්නේ .....!



දෙව්ලොව බඹලොව දෙවිවරු බණ අසන්ට එන්නේ
මනුලොව නුවණැති මිනිසුන් නිවන් මඟෙහි යන්නේ

දෙව් මිනිසුන්ගේ උත්තම ගුරු දෙවිඳුන් වන්නේ
"සත්ථා දේව මනුස්සානං" බුදුහිමි නමදින්නේ

සාදු! සාදු! මම ගෞතම මුනිඳු සරණ යන්නේ .....!



ලෝ සත විඳිනා දුක ගැන පැහැදිලි කරමින්නේ
දුකින් මිදෙන නිවන් ලබන මඟ ගැන පවසන්නේ

චතුරාර්ය සත්‍යය ගැන අවබෝධය දෙන්නේ
“බුද්ධ” ගුණෙන් යුතු සම්බුදු සමිඳුන් නමදින්නේ

සාදු! සාදු! මම ගෞතම මුනිඳු සරණ යන්නේ .....!



අප මුනිඳුගේ බුදු නුවණට හිරු සඳු පරදින්නේ
සීල සමාහිත ගුණයට ලොවම වසඟ වන්නේ

දියෙන් උඩට විත් විහිදුන පියුමක් විලසින්නේ
“භගවා” යන ගුණයෙන් යුතු බුදු හිමි නමදින්නේ

සාදු! සාදු! මම ගෞතම මුනිඳු සරණ යන්නේ .....!







**‘අමිල අමා දහම් ගඟ’**

**මහමෙව්නාව සදහම් පුස්තකාලය**

**කළමනාකරණ හා මූල්‍ය පීඨය**

**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**Mahamevnawa Sadaham Library**

**Faculty of Management and Finance**

**University of Colombo, Sri Lanka**

**Preparations are subject to decay. Accomplish your TASK without delay.** වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ